# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2193/8 - 2020 සැප්තැම්බර් මස 15 වැනි අඟහරුවාදා - 2020.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ බදුල්ල මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතු කොට ගෙන බදුල්ල මහ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ බදුල්ල මහ නගර සභාවේ අංක 13 - කණුපැලැල්ල කොට්ඨාසයට තේරී පත්වූ බාලගේ ආතර් සිල්වා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම බදුල්ල මහ නගර සභාවේ අංක 13 - කණුපැලැල්ල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රත්නායක මුදියන්සේලාගේ නාලක නිශාන්ත විජයරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බදුල්ල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී, එච්. අයි. ආර්. හතුරුසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් රත්නායක මුදියන්සේලාගේ නාලක නිශාන්ත විජයරත්න, බදුල්ල මහ නගර සභාවේ අංක 13 - කණුපැලැල්ල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**එච්. අයි. ආර්. හතුරුසිංහ,**
තේරීම්භාර නිලධාරී,
බදුල්ල මහ නගර සභාව.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
බදුල්ල.

10 - 14

1A - G 32891 — 30 (2020/09)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*